# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2437/59 – 2025 මැයි මස 24 වැනි සෙනසුරාදා – 2025.05.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියෙන් හා 223 වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ඒ. ඒ. සී. ජේ. රාජරත්න වන මා විසින් සාදන ලද පහත සඳහන් නියෝග මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**ඒ. ඒ. සී. ජේ. රාජරත්න,**
සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර.

2025 ජනවාරි මස 31 වන දින,
ආණ්ඩුකාර කාර්යාලය,
නව නගරය,
රත්නපුර දී ය.

**නියෝග**

සබරගමුව පළාත තුළ පිහිටි ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන මාර්ගවල හා පටු මාවත්වල ස්ථිර ලකුණු හා සීමා ලකුණු කිරීම ද, සැලසුම් පිළියෙළ කිරීමට කටයුතු සැලැස්වීම ද, ඒවායෙහි නාම ලේඛනයක් දක්වමින් දැන්වීම් පළ කිරීමේ කටයුතු සඳහා, කාර්යය පටිපාටි නියම කිරීම සඳහා වන නියෝග මාලාව 2023.01.24 දිනැති අංක 2316/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් ප්‍රසිද්ධ කරමින් ලබාදුන් වසරක කාලය ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් සහ 223 වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී ප්‍රාදේශී සභා පනතේ 24 වන වගන්තිය යටතේ වන කාර්යය ඉටු කිරීම සඳහා 2024.01.24 වන දින සිට මාස විසිහතරක වැඩිදුර කාලයක් සඳහා සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

EOG 05 – 0143

1A – PG7098 – 05 (2025/08)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*